Embassy of the United States of America
Colombo

# PRESS RELEASE

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: shenjy@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20150201S

## ඡන්දදායකයන්ට වඩා හොඳින් සේවය කිරීමට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට එක්සත් ජනපදය ආධාර කරයි.

**පෙබරවාරි 1, 2016:** ඡන්දදායකයන්ගේ ප්‍රශ්නවලට හොඳින් ඇහුම්කන්දී ඒවා විසඳීමට සහාය ලබා දෙනු පිණිස එක්සත් ජනපදයේ ආධාරයෙන් ජනවාරි 28-29 දින දෙකේ පැවැත්වූ වැඩමුළුවකට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පර්යේෂණ නිලධාරීන් 50 දෙනෙක් සහභාගී වූහ. සිංහලෙන් හා දෙමළෙන් පැවැත්වූ මෙම පුහුණු වැඩසටහන, අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනයේ (USAID) දළ වශයෙන් රුපියල් මිලියන 73ක් ( ඩොලර් 509,000) වූ ව්‍යාපෘතියේ කොටසකි. මෙහි අරමුණ වන්නේ ඔවුන් නියෝජනය කරන ජනතාවට වඩාත් ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් සැපයීමට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට සහාය වීමයි.

"පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩි දියුණු කිරීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ජනතාවට වඩා හොඳ සේවයක් සැපයීමට ආධාරයක් වේ" යයි එක්සත් ජනපද තානාපති අතුල් කෙෂාප් ප්‍රකාශ කළේය. වැඩි දුරටත් ඔහු කියා සිටියේ "මේ මගින් යහ පාලනයේ මූලධර්ම පෝෂණය කිරීමටත් ශක්තිමත් කිරීමටත් හැකි වන බව"යි.

පසුගිය සතියේ පැවති පුහුණු වැඩසටහන, පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යංශය සමග සහයෝගයෙන් පවත්වන වැඩමුළු මාලාවක දෙවැන්න වේ. මෙම වැඩමුළුවේදී පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට මූල්‍ය සැලසුම්, අයවැය, පර්යේෂණ, මහජන සබඳතා හා වෘත්තීය සංවර්ධනය පිළිබඳ තාක්ෂණික සහාය ලබා දෙන ලදී.